ඉහළ අත පහළ අතට වඩා උතුම්ය

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) මින්බර් වේදිකාව මත
සිට සදකාව (දානය), තැන්පත් කම හා ඉල්ලීම පිළිබඳ මතක් කරමින් මෙසේ පවසා සිටියහ. "ඉහළ
අත පහළ අතට වඩා උතුම්ය. ඉහළ අත යනු එය වියදම් කරන අතයි. පහළ අත යනු ඉල්ලා සිටින අතයි." [صحيح] [متفق عليه]

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) මින්බර් වේදිකාව මතට වී දේශනා කරමින් සදකාව (දානය), තැන්පත් කම හා ඉල්ලීම පිළිබඳ උපදෙස් දුන්හ. වියදම් කරන, පිරිනමන උසස් අත, ඉල්ලා සිටින පහත් අතට වඩා අල්ලාහ් වෙත උතුම්ය. ආදරණීයය.

http://sunnah.global/hadeeth/si/show/3599